ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

<u>පුවත්පත් නිවේදනය</u>

## ආරක්ෂක ක්ෂේත්‍රයේ ද්විපාර්ශවික සහයෝගීතාවය ඉහළ නැංවීමට ආරක්ෂක සමුළුවක් සහ ප්‍රදර්ශනයක්

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් දෙරට අතර ආරක්ෂක උපකරණ සම්බන්ධයෙන් සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා පවත්වනු ලබන ප්‍රථම ඉන්දියා - ශ්‍රී ලංකා ආරක්ෂක සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය 2023 ජූනි 7 වන දින කොළඹ, ටාජ් සමුද්‍ර හෝටලයේ දී පැවැත්වේ. ඉන්දියානු ආරක්ෂක ක්ෂේත්‍රය, ශ්‍රී ලංකාවේ ව්‍යවාසකයන්, ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ විශේෂ කාර්ය බලකාය මේ සඳහා සහභාගී වනු ඇත. ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වනු ඇති අතර ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි සහ ත්‍රිවිධ හමුදාපතිවරුන් ඇතුළු ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද මේ සඳහා සහභාගී වනු ඇත.

2. මෙම සුවිශේෂී වැඩසටහනට ආරක්ෂක උපකරණ නිෂ්පාදනය සම්බන්ධයෙන් දෙරට හැකියාවන් සහ ධාරිතාවයන් අවධාරණය කෙරෙන සම්මන්ත්‍රණයක් ද පුළුල් පරාසයක ආරක්ෂක නිෂ්පාදන ප්‍රදර්ශනය කෙරෙන ප්‍රදර්ශනයක් ද ඇතුළත් වනු ඇත. අන්තර්ග්‍රහණීය සහ සහයෝගී නියැළීම් හරහා ශ්‍රී ලංකාව සමඟ සබඳතා ගැඹුරු

කිරීමට ඉන්දීය රජය ගන්නා ප්‍රයත්නයන් අනුව පැවැත්වෙන මෙම වැඩසටහන ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ ධාරිතා ගොඩනැගීම සහතික කරමින් ආර්ථික ප්‍රතිසාධනය සඳහා නව සහයෝගිතා ක්ෂේත්‍ර හඳුනා ගැනීම අරමුණු කරයි. මෙම ප්‍රදර්ශනය විවිධ ආරක්ෂක උපකරණ දැක බලා ගැනීමේ අවස්ථාව මහජනතාවට ද ලබා දෙමින් මහජනතාව උදෙසා ද විවෘතව පවතිනු ඇත.

3. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව ඉන්ද්‍රා රේඩාර්, උසස් ගැඹුරු මුහුද නිරීක්ෂණ යාත්‍රා, L 70 තුවක්කු, ඩෝනියර් ගුවන්යානා සහ හමුදා පුහුණු සිමියුලේටර් වැනි පුළුල් පරාසයක ඉන්දියානු ආරක්ෂක උපකරණ සාර්ථකව මෙහෙයවයි. එසේම, ඉන්දීය සන්නද්ධ හමුදා ද Fast Interceptor Crafts භාවිතා කරන අතර කොළඹ පාවෙන තටාකය නවීකරණය ද කරයි. මෑත කාලයේ දී ඉන්දීය රජය පාවෙන තටාකය, සමුද්‍රීය මුදවාගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ ඩෝනියර් ගුවන් යානා සැපයීමට ද එකඟ වී ඇති අතර මෙම පියවර ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ධාරිතා ගොඩනැගීමට ඉවහල් වනු ඇත.

***

කොළඹ
2023 ජූනි 07